වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயற்சாதனை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2025

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

අංක 09

පිලිප් ගුණවර්ධන මාවත

කොළඹ 07

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 219

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

1960 දශකයේ දී කුඩා ඒකකයක් ලෙස ආරම්භ කරන ලද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 1970 දී අරඹන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතට ගෙන 1996 දී ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට උසස් විය.

නිරෝගිමත් ක්‍රියාශීලි සමාජයක් උදෙසා ක්‍රීඩා සංස්කෘතියක් සහ විනයගරුක බව තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨයන් බිහි කරමින් ක්‍රීඩාවේ උන්නතිය සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරන ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව දැනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

" ජාතික අභිමානය උදෙසා ජවසම්පන්න ශ්‍රී ලාංකිකයෙක් . "

- **මෙහෙවර**

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක්, තරඟකාරී ක්‍රීඩාවන්හි ජයග්‍රාහී මානසිකත්වයක් නිර්මාණය, සමෘද්ධිමත් ක්‍රීඩා සංස්කෘතියක් ඇති කිරීම තුළින් ක්‍රීඩාවේ විශිෂ්ඨත්වය ලඟා කර ගැනීම.

- **අරමුණු**

1. **සමාජයේ සියළුම අංශවලට ක්‍රීඩාවට අවකාශය ලබාදීම තුළින් ශාරීරික සුවතාවය, ඵලදායීතාවය හා තෘප්තිය වර්ධනය කිරීම.**
2. **ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් ජයග්‍රහණ අත්කර ගැනීම.**
3. **ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යාන්තර තලයට ගෙනයා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම.**
4. **ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යාන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම.**

1.3. සංවිධාන සටහන



Department of Sports Development
Director General
Additional Director General
Director (Planning)
Director (Admin)
Chief Internal Auditor
Chief Accountant
Director (Sports)
Director (Engineer)
Asst. Director (Admin)
Accountant
Asst. Director (Sports)
Deputy Director (Sports)
Engineer
Derector procurement
Administrative Officer
Headquarters Sports Officer
ICT Officer
Translator
DO
D. O.
Planning & Programme Asst.
Human Resource Development Asst.
Curator
Sports Coach
Technical Officer
MSO
Sport Officer
Asst. ICT Officer
M.S.O.
Warden
Asst. Warden
Ground Clerk
Exercise Assistant
Driving Service
Cook
O.E.S.
Asst. Cook
Ground Assistant
Life Guard

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- ❖ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
- ❖ පාලන අංශය
- ❖ ගිණුම් අංශය
- ❖ සැලසුම් අංශය
- ❖ සංවර්ධන අංශය
- ❖ ක්‍රීඩා අංශය
- ❖ අභ්‍යන්තර විගණන අංශය
- ❖ ප්‍රසම්පාදන අංශය

1.5. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතනගත අරමුදල්

රජයේ ඒකාබද්ධ අරමුදල

1.6. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අදාළ නොවේ

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

<u>2.1 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය</u>

අනු අංකය	වැය ශීර්ෂය	විස්තරය	2025 ප්‍රතිපාදන (රු.මිලි)			2025.12.31 දිනට මූල්‍ය වියදම (රු.මිලි.)			මූල්‍ය ප්‍රගතිය (%)	සමුච්චිත භෞතික ප්‍රගතිය (%)
			මුල් ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන	අතිරේක ප්‍රතිපාදන සහ මාරු කිරීම් මත ශුද්ධ ප්‍රතිපාදන	ක්‍රී.සං.දෙ	දි.ලේ/ අමාත්‍යාංශය	එකතුව		
1	219-2-2-17 – 2001	පළාත් හා දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඉදි කිරීම.	1335.00	-	1335.00	654.392	2.285	656.627	49%	96%
2	219-02-02-29-2104	කල්මුනේ සන්දන්ගනී ක්‍රීඩා සංකීර්ණය	150.00	-	150.00	-	-	-	-	-
3	219-02-02-17-2104-66	ශාන්ත ජෝශප් වාස් විද්‍යාලයේ ක්‍රීඩා සංකීර්ණය	60.00	-	60.00	60.00	-	60.00	100%	85%
4	219-2-2-0-1409	**දක්ෂතා සංවර්ධනය**								
	219- 02- 02 – 1508 – 24	ක්‍රීඩකයන්ට ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා පහසුකම් සැලසීම	150.00	-	150.00	128.459	-	128.459	86%	99%
	219- 02- 02 – 1508 – 25	දෙවන ස්ථරයේ ක්‍රීඩක සංචිතය - ක්‍රීඩා ශක්ති	200.00	-	200.00	53.305	0.799	54.104	27%	91%
	219- 02- 02 – 1508 – 26	ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලි	500.00	(123.00)	377.00	174.597	-	174.597	46%	68%
	219- 02- 02 – 1508 – 27	ජාතික ක්‍රීඩා තරගාවලිය	200.00	123.00	323.00	249.121	29.558	278.679	86%	100%
	219- 02- 02 – 1508 – 28	උසස් දක්ෂතා සහිත ක්‍රීඩක සංචිතය සඳහා පහසුකම් සැලසීම	150.00	-	150.00	94.022	-	94.022	63%	100%
	219- 02- 02 –1203 – 27	ජාතික සංචිත සඳහා පෝෂණය	400.00	-	400.00	194.181	-	194.181	49%	93%

2.1.1. විශේෂ ජයග්‍රහණ

අනු අංකය	ක්‍රීඩා තරඟාවලියේ නම	ක්‍රීඩක/ ක්‍රීඩිකාවගේ නම	ක්‍රීඩාව	ඉසව්ව	පැවැත් වූ රට	දක්ෂතාවය (රන්, රිදී, ලෝකඩ, ශූරතාවය, අනු ශූරතාවය)
01	Track Classic	පී. රුමේෂ් තරංග	මළල ක්‍රීඩා	හෙල්ල විසිකිරීම	ඕස්ට්‍රේලියාව	ලෝක ශ්‍රේණිගත කිරීම්වල 7වන ස්ථානයට පැමිණීම
02	3 වන යොවුන් ආසියානු තරගාවලිය	ලහිරු අචින්ත	මළල ක්‍රීඩා	මීටර් 1500	බහරේන්	රන් පදක්කම
03	3 වන යොවුන් ආසියානු තරගාවලිය	චමින් ලෝචන ශනුක කොස්තා ආධිත්‍යා බණ්ඩාර චමිදු සත්සර නිරුධක විසල්	මළල ක්‍රීඩා	සහය දිවීම	බහරේන්	රිදී පදක්කම
04	සත් සාමාජික ජේෂ්ඨ ආසියානු රග්බි ශූරතාවලිය	ශ්‍රී ලංකා රග්බි ජාතික කණ්ඩායම (පිරිමි)	රග්බි	සත් සාමාජික	ශ්‍රී ලංකාව	3 වන ස්ථානය
05	පොදු රාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ශූරතාවය	ශ්‍රී ලංකා අත්පන්දු ජාතික කණ්ඩායම	අත්පන්දු		මාලදිවයින	2 වන ස්ථානය
06	Mr. Universe 2025	කේ.ඩී. මායාදුන්න	කායවර්ධන		තායිලන්තය	රන් පදක්කම් 03
07	Mr. Universe 2025	ජී.ඩී.වනිගසේකර	කායවර්ධන		තායිලන්තය	රන් පදක්කම් 01

2.1.2. ඉදිරි ඉලක්ක - 2026

1.දක්ෂතා සංවර්ධනය

1. 2026 වර්ෂයේ පැවැත්වීමට නියමිත ආසියානු වෙරළ ක්‍රීඩා උළෙල, ආසියානු ක්‍රීඩා උළෙල, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල හා යොවුන් ඔලිම්පික් ක්‍රීඩා උළෙල ඉලක්ක කර ගනිමින් පුහුණු සංචිත ආරම්භ කිරීමට කටයුතු කරන අතර එම තරගාවලි තුලින් පදක්කම් ලබා ගනිමින් ඉහළ දක්ෂතා අතරට පැමිණීම.
2. ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන මගින් තෝරා ගන්නා ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංචිත ගත කර පුහුණුවීම ආරම්භ කිරීම හා ඔවුනට අවශ්‍ය පෝෂණ දීමනා පහසුකම් ලබාදීම.
3. ජාතික සංචිතවල සිටින ක්‍රීඩක ක්‍රීඩකාවන් සඳහා ජාත්‍යන්තර පුහුණුකරුවන්ගේ යටතේ පුහුණුව ලබාදීමට කටයුතු කිරීම.
4. ඔලිම්පික් මෙහෙයුම් වැඩසටහන යටතේ තෝරාගන්නා ලද ක්‍රීඩක ක්‍රීඩකාවන් සඳහා පහසුකම් ලබාදීම තුළින් 2028 වර්ෂයේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල ඉලක්ක කර ගනිමින් පුහුණු සංචිත පවත්වාගෙන යාම.
5. ක්‍රීඩා සංස්කෘතියක් රට තුළ නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය නව ව්‍යාපෘති වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
6. ක්‍රීඩාවේ දෙවන පෙළක් නිර්මාණය කිරීම සඳහා ක්‍රීඩා ශක්ති වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
7. ක්‍රීඩා යටිතල පහසුකම් ලබා දීමේ වැඩසටහන යටතේ පාසල් හා ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

2.යටිතල පහසුකම් සංවර්ධනය

1. මන්නාරම් ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 ධාවන පථය ඉදිකිරීම
2. කල්මුනේ සන්දන්ගනී ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ඉතිරි වැඩ අවසන් කිරීම.

අධ්‍යක්ෂ ජනරාල්

CS Scanned with CamScanner

9

03. පරිච්ඡේදය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තතය 2025 Rs.	2024 Rs.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ACA-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ACA-1
-	ජාත්‍යන්තර වෙළදාම මත බදු	3	-	-	ACA-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ACA-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,546,134,000	2,322,418,384	ACA-3
-	තැන්පතු		67,746,833	203,511,652	ACA-4
-	අත්තිකාරම් ගිණුම්		12,758,195	13,341,025	ACA-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්			-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		2,626,639,028	2,539,271,061	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		2,626,639,028	2,539,271,061	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		127,263,060	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		2,499,375,968	2,539,271,061	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
-	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	232,831,035	207,010,961	ACA-2(ii)
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	613,991,338	501,138,352	ACA-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	730,593,533	777,589,327	ACA-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ACA-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	93,300	ACA-2(ii)
-	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,577,415,905	1,485,831,940	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	839,135,750	801,679,613	ACA-2(ii)
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	105,427,146	218,414,840	ACA-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ACA-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ACA-2(ii)
-	හැකියා වර්ධනය	14	2,256,846	984,600	ACA-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	553,165,516	-	ACA-2(ii)
-	මුළු මූලධන වියදම් (උ)		1,499,985,258	1,021,079,053	
	තැන්පතු ගෙවීම්		56,184,442	180,479,094	ACA-4
	අත්තිකාරම් ගෙවීම්		16,171,863	12,212,828	ACA-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		72,356,305	192,691,922	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,149,757,468	2,699,602,915	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(650,381,500)	(160,331,854)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(650,381,500)	(160,331,854)	ACA-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ACA-3
			-	-	

1

CS Scanned with CamScanner

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සතය 2,025 රු.	2,024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,031,257,301	4,011,779,749
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	134,447,510	49,999,596
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-
මුළු වත්කම්		**4,165,704,810**	**4,061,779,345**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(97,763,404)	(89,579,780)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,031,257,301	4,011,779,749
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	93,151,827	12,079,680
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	139,059,087	127,499,696
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		-
මුළු වගකීම්		**4,165,704,810**	**4,061,779,345**

පිටු අංක 01සිට 38 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 39 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :
ඒ .එච්. එම්. යූ. අරුණ බණ්ඩාර
ලේකම්
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :
එස්. අච්චුදන්
අධ්‍යක්ෂ ජනරාල්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක 09. පිලිප් ගුණවර්ධන මාවත.
කොළඹ 07

....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි~~/ප්‍රධාන ගණකාධිකාරී/
~~අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2026.02.27
... නුවන් ප්‍රසාද
[illegible] ගණකාධිකාරී
[illegible] දෙපාර්තමේන්තුව
කොළඹ 07

2

CS Scanned with CamScanner

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඊඕර-ඕ

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කතා 2025 රු.	2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	94,876,769	65,882,311
අග්‍රිම ලැබීම්	2,546,134,000	2,322,418,384
අත්තිකාරම් අයකර ගැනීම	11,930,680	12,518,749
තැන්පතු ලැබීම්	67,746,833	203,511,652
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,720,688,282**	**2,604,331,096**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	841,856,680	1,457,325,126
සහනාධාර සහ මාරුකිරීම්	700,235,951	736,858
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම,ප්‍රාග්ධන මාරුකිරීම්,හැකියා වර්ධනය,වෙනත් මූලධන වියදම්	891,106,918	727,016,337
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	557,440	8,333,113
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	127,263,060	-
අත්තිකාරම් ගෙවීම්	16,171,863	12,025,728
තැන්පතු ගෙවීම්	56,184,442	180,479,094
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,633,376,354**	**2,385,916,256**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**87,311,929**	**218,414,840**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	87,311,929	218,414,840
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**87,311,929**	**218,414,840**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(87,311,929)**	**(218,414,840)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-

3

CS Scanned with CamScanner

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව (රු)		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.99.00	විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම්	75,000,000.00	-	81,583,657.00	109%
2002.02.99	පොළී හා අනෙකුත්	1,400,000.00	-	1,582,649.00	113 %
2004.01.00	W & OP	10,000,000.00	-	12,065,735.00	121 %

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	2,670,000,000.00	2,670,000,000.00	2,577,415,905.00	97%
ප්‍රාග්ධන	2,860,000,000.00	2,860,000,000.00	1,499,985,258.00	52%

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය		නැත			
02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව		නැත			

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යූහයන්	-	300,091,009.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	243,964,538.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	847,179.00	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	3,486,354,574.00	-	-

3.9 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්ඩබ්ලිව්/ඒ/ ඩී එස් ඩී /2/25/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2026 ජුනි 19 දින

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
22 JUN 2026
අංක. 09, ඵිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.

CA
ACC
19/6/2...

ගණන්දීමේ නිලධාරී
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව සහ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල (භාෂාත්‍රයෙන්) පිටපතක් මේ සමඟ එවා ඇත.

ගිණුම් අංශය
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
23 JUN 2026
අංක. 09, ඵිලිප් ගුණවර්ධන මාවත, කොළඹ -07.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්: 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව (විගණිත මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා සම්පිණ්ඩන වාර්තාව මේ සමඟ එවමි)
2. ලේකම් - තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය (කරු. අවශ්‍ය කටයුතු සඳහා)

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. එස්වයිජ්/ඒ/ ඩී එස් ඩී /2/25/13 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 ජුනි 19 දින

ගිණුම් අංශය
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
23 JUN 2026
අංක. 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ -07.

ගණන්දීමේ නිලධාරී
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 219 - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කල යුතු වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02 / 2025 අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සීමා පිළිබඳ සංශෝධිත වාර්ෂික ඇස්තමේන්තුව හා භාණ්ඩාගාරයේ **SA 52** අනුව සමාලෝචිත වර්ෂය සඳහා වන අවම ලැබීම් සීමාව රු. 10,711,700 ක් වුවත් එය වැරදි ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඒසීඒ 05 ආකෘතියේ රු.10,711,170 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් (හර සටහන් ඇතුළුව) පිළිවෙලින් රු. 1,504,501 ක් හා රු. 284,991 ක් වුවත් දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගැලපුම් ප්‍රකාශය (ඒසීඒ 07) හි එම අගයන් අතර වූ ශුද්ධ වටිනාකම වන රු.1,219,510 ක් පමණක් අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා තිබීමෙන් එම අගයන් අතර රු.284,991 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) අංක 6000-0-0-16-88-0 දරණ තැන්පතු ලෙජරයේ ඇතුලත් කර නොතිබුණු අවුරුදු 02කට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකරන ලද රු.313,141 ක රැඳවුම් මුදල් පොදු තැන්පත් ගිණුමට ඇතුළත් කර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ස්ථාවර වත්කම් වටිනාකම රු.4,031,257,301 ක් වූ අතර, ඉන් රු. 3,573,108,101 ක් එනම් සියයට 89 ක්ම කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද, එම ශේෂය තුල පැවති වැඩ නිම කළ ව්‍යාපෘති වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. තවද, කෙරීගෙන යන වැඩ ශේෂය තුළ දෙපාර්තමේන්තුව විසින් වැඩ නිමකර වෙනත් රජයේ ආයතන හා පාසල්වලට භාරදී ඇති රු. මිලියන 682.62 ක් වටිනා ව්‍යාපෘති 10 ක්ද ඇතුළත්ව තිබුණු අතර, එම ව්‍යාපෘති හඳුනාගෙන එම ආයතන වලට විධිමත් ලෙස පවරා දී දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාරයේ **SA 82** ආකෘතිය සමඟ සැසඳීමේ දී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වූ දේපළ, පිරියත හා උපකරණ ශේෂය රු. 86,753,526 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2024 වර්ෂයේ අවසන් ශේෂය 2025 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන තිබූ මගී ප්‍රවාහන රථ වටිනාකම අතර රු. 25,300,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) විගණිත දින වූ 2026 ජනවාරි 23 දිනට සිගාස් වැඩසටහන පරීක්ෂා කිරීමේ දී තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය වෙත දෙපාර්තුමේන්තුව විසින් පවරා දී තිබූ වාහන 03 ක් ඉවත් නොකර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ස්ථාවර වත්කම්වල වටිනාකම රු. 30,900,000 කින් අධිගණනය වී තිබුණි.

1.6.3 මූල්‍ය වත්කම්

වැඩ තහනම් කර ඇති, විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගොස් සිටි නිලධාරීන් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.510,876 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කටයුතු කර නොතිබුණි.

1.6.4 දේපල පිරියත හා උපකරණ සංචිතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවෙන් ලබා ගත් තොරතුරු අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුව නමින් ලියාපදිංචි කර ඇති අංක **50-6937** දරණ ද්විත්ව කාර්ය (වාණිජ) රථය දෙපාර්තුමේන්තුවේ සිගාස් පද්ධතියේ මෙන්ම භෞතිකව ද නොපවතින බව නිරීක්ෂණය විය.

1.6.5 කුලී හා වැඩ අත්තිකාරම් සහ කුලි හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම

මහා භාණ්ඩාගාරය විසින් පිළියෙල කරන ලද ජනරජ ගිණුමේ දක්වා නොතිබුණු අංක 9188-219-0-2-0-33-0 දරණ කුලී හා වැඩ අත්තිකාරම් ශේෂය වූ රු. 86,753,526 ක් දෙපාර්තමේන්තු ගිණුම් වල දක්වා තිබුණි.

1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

49 වන ජාතික මහා ක්‍රීඩා උළෙලට නවාතැන් පහසුකම් සහ ආහාර ලබා ගැනීමේ දී ගෙවන ලද ප්‍රමාණය සහ එම සේවාවන් ලබාගත් බවට තහවුරු වන උපයෝගී ලේඛණ අතර එකතුව රු.2,525,050 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් නවාතැන් පහසුකම් සහ ආහාර ලබාගැනීම් සඳහා දරන ලද රු.2,525,050 ක වටිනාකම සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.6.7 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැඳීම් හා බැරකම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (අ)	වැඩ අවසන් කළ ව්‍යාපෘති හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා වෙනත් රජයේ ආයතන හා පාසල්වලට පවරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය.	1.6.2 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන් වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනය රු.220,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු. 138,825,024 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 37 ක් නිශ්චිත කාර්යයන් සඳහා උපයෝජනය නොකර ඉතිරි කරගෙන තිබුණි. තවද, සංවර්ධන වැඩසටහන් සඳහා වූ ශුද්ධ ප්‍රතිපාදනය වන රු.5,310,000,000 කින් රු.2,938,576,139 ක් වැය කර තිබූ අතර එම වෙන් කළ ප්‍රතිපාදන වලින් සියයට 45ක් ඉතිරි කරගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධාන අනුගමනය කරමින් නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකසාගෙන තිබීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 2 ක හා මූලධන වැය විෂයන් 4 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබුණු රු.164,500,000 ක ප්‍රතිපාදන කිසිදු උපයෝජනයක් සිදු නොකර මුළුමනින්ම ඉතිරි කරගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් වැය විෂයන් 36 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබිමෙන් එම වැය විෂයන්ට අදාල ප්‍රතිපාදිත මුදලෙන් සියයට 26 සිට සියයට 97 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි කරගෙන තිබුණු අතර එම ඉතිරිවීම් සඳහා දක්වා තිබූ හේතූන් ද පිළිගැනීමට නොහැකි තත්වයක පැවතුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) **2025** දෙසැම්බර් **31** දිනට භාණ්ඩාගාර පොත්වල වාර්තා කර තිබූ බැදීම් හා බැරකම් පිළිබඳ **SA 92** ප්‍රකාශනයෙහි ඇතුළත් රු.**11**,319,454 ක බැරකම් වලින් කිසිදු බැරකමක් විගණිත දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 හා 04 ඡේදයන්ට අනුව එක් එක් වියදම් ශීර්ෂයන් සඳහා වූ සියලුම බැදීම් හා බැරකම් ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු **CIGAS** පද්ධතියට ඇතුලත් කලයුතු වුව ද එලෙස ඇතුලත් කර නොතිබීමෙන් රු. 46,489,257 ක බැදීම් හා බැරකම් භාණ්ඩාගාරයේ පොත්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර වාර්තා **(S 92)** හි දක්වා ඇති බැරකම් ශේෂ 02 ක් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.1,792,377 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඈ) ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ **(CECB) 2025** දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතු බැරකම් ශේෂ රු.**100,734,886** ක් වූවද එය දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වල රු.51,804,561 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 48,930,325 ක ඌන ගණනය කිරීමක් නිරීක්ෂණය විය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූලා පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	අංක **2437/24** හා 2025 මැයි **21** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළකරන ලද 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝග	
(i)	**I** කොටසේ **6**	ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රීඩා සංගම් හෝ සම්මේලන ලියාපදිංචි කිරීමේ සහතිකයක් ජාතික ක්‍රීඩා සංගම් වෙත නිකුත් කරනු ලැබිය යුතු වුවද, මෙම වාර්තාවේ දිනය දක්වා එසේ කටයුතු කර නොතිබුණි.
(ii)	**I** කොටසේ **09**	ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවද, එය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(iii)	**II** කොටසේ **3 (i)**	මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට දින **90**ක් ඇතුළත ජාතික ක්‍රීඩා සංගම් හා සම්මේලන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව සඳහා ක්‍රීඩා

		අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා දිය යුතු වුවද, ඉදිරිපත්ව තිබූ ව්‍යවස්ථා 22 ක් සඳහා එලෙස කටයුතු කර නොතිබුණි.
(iv)	**III** කොටසේ **12 (v)**	සෑම දෙවසරකට වරක්ම සියළු ජාතික ක්‍රීඩා සංගම් / සම්මේලන පිළිබඳ තක්සේරු ඇගයීම් කිරීම් කොට වර්ගීකරණය ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ අදහස් විමසා සිදු කළ යුතුය. ඒ අනුව, සාමාජිකයන් **25** ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන **50** හෝ ඊට වැඩි නම් **A** ශ්‍රේණියද, සාමාජිකයන් ආයතන **15** ක් හෝ ඊට වැඩි ගණනක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන **10**ක් හෝ ඊට වැඩි එහෙත් රු. මිලියන **50**ට අඩු නම් **B** ශ්‍රේණියද, සාමාජිකයින් /ක්‍රීඩා සමාජ / අනුබද්ධ ආයතන ඕනෑම සංඛ්‍යාවක් සහිත වාර්ෂික පිරිවැටුම රු. මිලියන **10**ට අඩු නම් **C** ශ්‍රේණිය ලෙසද වර්ගීකරණය කළ යුතු වුවත්, එම නිර්ණායක අනුව කටයුතු නොකර වර්ගීකරණය කර තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 104	දෙපාර්තුමේන්තුව සතු වාහනයකට අදාළව අළුත්වැඩියාවන් සම්බන්ධ අමතර කොටස් කිසිවක් වාහනයේ නොමැතිවීම පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත පවරා තිබුණු අතර එම ප්‍රගතිය මේ දක්වා විගණනයට වාර්තා කර නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 177(1)	එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් කලින් දෙපාර්තමේන්තුවේ නිසි ප්‍රතිග්‍රාහක නිලධාරියාට ප්‍රේෂණය කිරීම මුදල් එකතු කරන නිලධාරියා විසින් සිදුකල යුතුව පැවතිය ද නියැදි විගණන පරීක්ෂණය අනුව ගාල්ල ක්‍රීඩා සංකීර්ණයෙන් මාස දෙකක දී දෛනිකව ඉපැයූ

	රු.1,803,415 ක ආදායමක් එදිනෙදා බැංකු ගත නොකර දින 05 කටත් අධික කාලයක් ඉක්මගිය පසු බැංකුගත කර තිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	රජයේ වාහන වල සෑම ඉන්ධන පරීක්ෂාවකින්ම පසු මාස 12 ක කාළ සීමාවකම පසුව හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව යන කරුණු අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවත්, දෙපාර්තුමේන්තුව චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.5 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරිම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කල තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 10 ක් ඇතුලත පියවිය යුතුව තිබුණ ද, ඊට පටහැනිව 49 වන ජාතික මහා ක්‍රීඩා උළෙල වෙනුවෙන් ලබා දී තිබූ රු. **1,287,250** ක අත්තිකාරම් ද, තවත් අවස්ථා 25 ක දී ලබා දී තිබූ රු.1,141,727 ක අතුරු අග්‍රිම ද අදාල කාර්යය නිම වී දින **19** - **116** ක කාල ප්‍රමාදයකින් පසුව නිරවුල්කර තිබුණි.

3.6 තැන්පතු

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් ශේෂය රු.139,062,087 ක් වූ අතර එයින් වර්ෂ 2 ට වැඩි කාලයක නිරවුල් නොවී පවතින රු.103,275,853 ක කොන්ත්‍රාත් ව්‍යාපෘති නිමකල, අත්හිටු වූ සහ විවිධ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ 571(2) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වනුයේ සමාජයේ සියළුම අංශ වලට ක්‍රීඩාවට අවකාශය ලබා දීම තුලින් ශාරීරික සුවතාවය, ඵලදායීතාවය තෘප්තිය වර්ධනය කිරීම, ක්‍රීඩා ක්ෂේත්‍රය තුළින් ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ජයග්‍රහන අත්කර ගැනීම හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර තලයට ගෙනයා හැකි අන්තර්ජාතික මට්ටමේ දැනුමැති දේශීය පුහුණුකරුවන් බිහි කිරීම සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීම වේ. එසේ වුවද, ඉහත ප්‍රධාන අරමුණු ඉටු නොකිරීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

- ක්‍රීඩාවේ උන්නතිය උදෙසා වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන වලින් ආසන්න වශයෙන් සියයට 40 ප්‍රමාණයක් ඉතිරි කර ගෙන උපයෝජනය නොකිරීම හේතුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීමේ අරමුණ ඉටු නොවීම.

- ගුවන් ටිකට්පත් නියමිත වේලාවට ක්‍රීඩකයන්ට ලබා නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල දී සැලසුම් කරන ලද අන්තර්ජාතික ක්‍රීඩා තරඟ 05 කට සහභාගී වීමට නොහැකි තත්වයක් උද්ගත වී තිබීමෙන් ක්‍රීඩා ක්ෂේත්‍රය තුලින් ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීම සීමා වී තිබීම.

- ආරම්භ කර තිබූ බොහොමයක් ව්‍යාපෘති අතරමග නවතා දැමීම හෝ නිම නොකර අත්හැර දැමීම හේතුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතියෙන් යුත් ක්‍රීඩා පහසුකම් ලබා දීමට නොහැකි වී තිබීම.

- දෙපාර්තමේන්තුව විසින් **2025** ජාතික ක්‍රීඩා දින දර්ශනයට අනුව ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන වල ජාතික තරඟ පැවැත්වීම හා ජාත්‍යන්තර තරඟ වලට සහභාගී වීමේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් නොකිරීම.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

(අ) ක්‍රීඩා ශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින් සුවිශේෂී දක්ෂතා සහිත ක්‍රීඩකයෙකු වෙනුවෙන් රු.10,000 ක මාසික දීමනාවක් ක්‍රීඩකයින් 900 දෙනෙකුට ක්‍රීඩා ඉසව් 21 ක් සඳහා ලබා දීමට අපේක්ෂා කර තිබුණු අතර ඒ සඳහා රු.මි. 200 ක මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා වෙන්කර තිබුණි. එසේ වුවද, තත්‍ය වශයෙන් මෙම දීමනා ක්‍රීඩා ඉසව් 18 ක් වෙනුවෙන් ක්‍රීඩකයින් 638 දෙනෙකු සඳහා ලබා දී තිබුණු අතර ඒ සඳහා රු.54,335,572 ක් වැයකර තිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) වෙන්කරවාගෙන තිබුණු මුදලින් සියයට 27 ක් පමණක් වැයකර තිබීම.

(ii) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු නිශ්චිතව හඳුනා නොගෙන මුලින් හඳුනාගත් අරමුණු සමාලෝචිත වර්ෂයේ දී මුලුමනින්ම වෙනස් කර තිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු නිශ්චය කර නොතිබීම හා අරමුණු ලඟා කර ගැනීම පිළිබඳ පසු විපරම් වාර්තාවක් හෝ ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කර නොතිබීම.

(iii) 2025 වර්ෂයේ දී තෝරාගත් ක්‍රීඩකයෙකු වෙත අඛණ්ඩව වර්ෂයකට දීමනා ලබා දීම සඳහා සැලසුම් කර තිබුණද එසේ නො‍කරන ලද අවස්ථා නිරීක්ෂණය වී තිබීම සහ ඊට අදාල සාධාරණ හේතු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම.

(iv) මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය නිශ්චය කර ගැනීමට අදාල දත්ත පද්ධතියක් නඩත්තු නොකිරීම.

(ආ) ක්‍රීඩා පෝෂණ දීමනා වැඩසටහන ක්‍රියාත්මක කිරීම

2025 වර්ෂයේ දී ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.400,000,000 ක මුදලක් වෙන්කරවාගෙන තිබුණු අතර ක්‍රීඩා සංචිත වලට තෝරාගත් ක්‍රීඩකයෙකු වෙනුවෙන් රු.60,000 ක මාසික දීමනාවක් ක්‍රීඩකයින් 333 දෙනෙකුට ක්‍රීඩා ඉසව් 11 ක් සඳහා ලබා දීම වෙනුවෙන් රු.194,180,894 මුදලක් වැයකර තිබුණි. තවද, ඉහත පරිදි ලබා දෙන දීමනාව වෙනුවට නේවාසිකව පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මඟින් පෝෂ්‍යාදායී ආහාර වේලක් ලබා දීම ද සිදුවේ.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත දෝෂයන් නිරීක්ෂණය විය.

(i) වාර්ෂිකව තෝරාගන්නා ලද ක්‍රීඩකයින් සංඛ්‍යාව කොපමණ ද යන්න හා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණු පිළිබඳව විගණනයට වාර්තා කර නොතිබුණි.

(ii) මෙම වැඩසටහන තුල සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ නියෝජනයන් පිළිබඳ දත්ත පද්ධතියක් හෝ ඔවුන් විසින් ලබාගත් ජයග්‍රහණ පිළිබඳ විස්තර ඉදිරිපත් නොවීමෙන් මෙම වැඩසටහනේ සාර්ථකත්වය නිශ්චය කර ගැනීමට නොහැකි විය.

(iii) ක්‍රීඩා වෛද්‍ය ආයතනය විසින් නිර්දේශිත ආහාර වට්ටෝරුව වෙනුවට දෙපාර්තමේන්තුවේ ආහාර වට්ටෝරු නේවාසික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දී තිබුණි.

(iv) නේවාසික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ආහාර පිසීමේ කටයුතු සිදු කිරීමේ දී සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කර නොතිබුණි.

(v) විගණනයට ලක්කල **2025** දෙසැම්බර් 11 වන දින ක්‍රීඩා නේවාසිකාගාරයේ නේවාසිකව සිටි ක්‍රීඩකයන්ගේ ප්‍රමාණය නොසලකා වර්ෂය පුරාම ක්‍රීඩකයින් 50 දෙනෙකු නේවාසිකව සිටින බව උපකල්පනය කරමින් මෙම වැඩසටහන යටතේ වියළි ආහාර මිල දී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. **53**,216,533 ක වියදමක් දරා තිබුණි. මේ හේතුවෙන් ක්‍රීඩකයින් 50 දෙනෙකු වෙනුවෙන් දැරිය යුතු උපරිම වියදම් රු.36,000,000 ක් වුවද, ඒ සඳහා රු. **53**,216,533 ක වියදමක් දරා තිබීමෙන් රු.17,216,533 ක නිසි අධිකාරී බලයකින් තොර ගෙවීමක් සිදු කර තිබුණි. තවද, 2025 දෙසැම්බර් 11 වන දින සිදුකරන ලද නේවාසිකාගාර ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නේවාසිකව සිටි ක්‍රීඩක සංඛ්‍යාව 16 දෙනෙකු පමණක් වූ බැවින් ද, එක් එක් දවස් තුල නේවාසිකව සිටි ක්‍රීඩකයන් පිළිබඳ ලේඛණයක් හෝ වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් නොවීමෙන් ද තත්‍ය වශයෙන් නේවාසිකව පුහුණු කටයුතු වල නිරතව සිටි ක්‍රීඩකයින් සංඛ්‍යාව 50ක් නොව ඊට අඩු බව තහවුරු විය. ඒ අනුව නේවාසිකාගාරයේ නේවාසිකව සිටි ක්‍රීඩකයින් වෙත පෝෂණ ආහාර සැපයීමේ දී විශාල මූල්‍ය සාවද්‍ය පරිහරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) මේ වනවිට රු. 233,190,000 ක් වැය දරා ඇති අර්ධ වශයෙන් නිම වී පවතින බිංගිරිය ගෘහස්ථ ක්‍රීඩාංගනය ඇතුළත වල් බිහිවී වර්ෂාවට හා හිරුඑළියට නිරාවරණය වෙමින් පැවතුණු අතර, ගොඩනැගිල්ලේ වහලය සෑදීමට ගෙනා යකඩ කාප්ප, ගොඩනැගිල්ල තුළ බිම දමා තිබීම හේතුවෙන් එම කාප්ප දිරාපත් වෙමින් පැවතුණි. වර්තමානය වන විටත් ඉදිකිරීම් කටයුතු නිමකර උපරිම ඵලදායීතාවයක් වයඹ පළාත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හා ජනතාවට ලබා ගැනීමට

නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. තවද, ඉහත ක්‍රීඩා සංකීර්ණය සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ද මීටර් 200 හා මීටර් 400 ධාවන පථයන් ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.මි.39.89 ක හා රු.මි.3.65 ක වියදම් දරා තිබුණි. එමෙන්ම, මෙම ක්‍රීඩා සංකීර්ණය ඉදිකර තිබූ හෙක්ටයාර් 6.931 ක් හෙවත් අක්කර 15 රූඩ් 02 පර්චස් 8.5 ක ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමටද වසර 09 කට ආසන්න කාලයක සිට කටයුතු කර නොතිබුණි .

(ආ) මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ අත්හිට වූ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් අයකර ගැනීමට ඇති අත්තිකාරම් මුදල් රු. 6,398,300 ක් සම්බන්ධයෙන් මු.රෙ. 104 අනුව පරීක්ෂණයක් සිදුකර ඉදිරි කටයුතු සිදු කරන බවට විගණනයට දන්වා ඇති නමුත් විගණිත දින දක්වාම එම අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

(අ) ක්‍රීඩා පාසැල් ලෙස තෝරාගත් පාසල් 6 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

ක්‍රීඩා පාසැල් ලෙස තෝරාගත් පාසල් 6 ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 200 ක ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබුණි. එසේ වුවද, පාසැල් 06 ක් වෙනුවට පාසැල් 07 ක් සඳහා රු.මිලියන 170 ක් ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එසේ අනුමැතියකින් තොරව නිදහස් කර තිබුණු රු. මිලියන 20 ක ප්‍රතිපාදන පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉතිරි පාසැල් 06 සඳහා ලබා දී තිබූ රු.මිලියන 150 කින් රු.මිලියන 15.5 ක් පමණක් වර්ෂය අවසාන වන විට වැය කර තිබුණි. එහි භෞතික ප්‍රගතිය සියයට 10 ක හා සියයට 70 ක අතර පරාසයක පැවතුණි.

(ආ) ක්‍රීඩා සංස්කෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් හා මහජන ක්‍රීඩාංගන 125 ක් සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම වෙනුවෙන් රු.මිලියන **484.1** ක මුදලක් වෙන්කර තිබුණ ද ඉන් රු.**427.6** ක් දිසිත්‍රික් ලේකම්වරුන් වෙත මුදා හැර තිබුණි. එසේවුවද, විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව කිසිදු පාසැලක ක්‍රීඩා පිටි සංවර්ධනය කර නිමකර තිබුණු බවට තහවුරුවක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, මූල්‍ය ආධාර ලබා දී තිබූ පාසැල් 15 ක කිසිදු භෞතික හෝ මූල්‍ය ප්‍රගතියක් ද නොවිය.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ ප්‍රධාන ක්‍රීඩා මණ්ඩපයේ හා ඇතුලත මාර්ගයන්හි ඉතිරි වැඩ සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.96,689,037 ක් වූ අතර, ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුවේ වටිනාකම රුපියල් මිලියන 50-100 අතර පැවතිය දී ඊට අදාල CIDA ලියාපදිංචිය C5 ලෙස තිබිය යුතු වුවද, ඊට පටහැනිව C4 හෝ ඊට ඉහළ ශ්‍රේණි ලෙස දක්වා පුවත්පත් දැන්වීම පලකර තිබුණි. ඒ අනුව ලැබුණු ලංසු අතර එක් ලංසුකරුවෙකු තෝරාගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීමෙන් සහ පළමු පුවත්පත් දැන්වීම අහෝසි කර නැවත පුවත්පත් දැන්වීම් පළකිරීම වෙනුවට එය C5 හෝ ඊට ඉහළ ශ්‍රේණි ලෙස පමණක් සංශෝධනය කර පුවත්පත් දැන්වීම පලකර තිබීමෙන් හා එම පුවත්පත් දැන්වීම අනුව කිසිඳු ලංසුවක් ඉදිරිපත් වී නොතිබීමෙන් මෙම ප්‍රසම්පාදනය " ප්‍රසම්පාදනය සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ වූත්, සමාන වූත්, උපරිම අවස්ථාවන් ලබාදීම" යන මූලධර්මය හා "විනිවිධභාවය හා සංගතභාවය" යන මූලධර්මය උල්ලංඝනය කරමින් සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ග්‍රාමීය පාසල් හා යෞවන සමාජ සඳහා ක්‍රීඩා යටිතල පහසුකම් ලබාදීමේ වැඩසටහන යටතේ රු.19,400,000 ක මුදලක් වැයකර උසපැනීමේ මෙට්ට මිල දී ගෙන තිබුණු අතර මෙම ප්‍රසම්පාදන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර තාක්ෂණික නිලධාරියෙකු යොදවා ගෙන අවශ්‍ය පිරිවිතරයන් පිළියෙල කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 අනුව බැඳියාවන් පිලිබඳ සටහනය හි 1.5.4 ඡේදය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සාමාජිකයන් දෙදෙනෙකු විසින් බැඳියාවන් පිළිබඳ සටහන ප්‍රකාශය අත්සන් කර නොතිබුණි.

(iii) ඉහත මෙට්ට ඉතා අඩු පිරිවැයකින් හා උසස් ගුණාත්මක භාවයකින් යුක්තව ප්‍රසම්පාදනය සිදු කිරීම සඳහා දේශීය නිෂ්පාදකරුවන් සිටියදීත් එය නොසලකා උසපැනීමේ මෙට්ට නොවන වෙනත් ක්‍රීඩා භාණ්ඩ සැපයීම සඳහා ලියාපදිංචි වී තිබුණු සැපයුම්කරුවන්ගෙන් වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල කැඳවීම් සිදු කර තිබීමෙන් හා ඉදිරිපත් කර තිබූ එකම ආයතනයක මිල පදනම් කරගෙන ප්‍රසම්පාදනය සිදුකර තිබීමෙන් අවම පිරිවැයකින් යුත් ගුණාත්මක භාණ්ඩ මිල දී ගැනීමට තිබූ අවස්ථාව අහිමි කරගෙන තිබුණි.

(iv) මිල දී ගෙන තිබූ උස පැනීමේ මෙට්ට විගණිත දින වන විටත් අදාල පාසැල් හා යෞවන සමාජ වෙත බෙදා හැරීමකින් තොරව ගබඩාවක දමා තිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

(අ) මාතර කොටවිල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ දැනටමත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 125 දෙනෙකුට නවාතැන් ගත හැකිව පැවතුණ ද එම ක්‍රීඩා සංකීර්ණයේ නේවාසිකාගාරය ඌන උපයෝජිතව පැවතුණු අතර 2025 වර්ෂයේ දී නේවාසිකාගාරය යාබදව රු. මිලියන 20.33 ක් වැය කර ඉදිකරන ලද භෝජනාගාරය සහිත මුළුතැන්ගෙය ද ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තුමේන්තුව සතුව වාහන 12 ක් පවතින අතර එම වාහන අතරින් වාහන 03 ක් මාස 09 සිට වසර 02 ක් දක්වා හා මාස 09 ක කාළයක් දක්වා නිෂ්ක්‍රියව හෝ ඌණ උපයෝජනව පවතුණ අතර මෙම වාහන සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 18 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය ඉදිකර ඇති හෙක්ටයාර් 6.4102 ක් වූ ඉඩම් කොටස ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අපම/24/1311/618/063 හා 2024 ජූලි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණ ද, මෙතෙක් එම ඉඩම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 අනාර්ථික ගනුදෙනු

2025 සැප්තැම්බර් 19 වන දින සිට 2025 සැප්තැම්බර් 28 දින දක්වා එංගලන්තයේ ජිබෝල්ටාහිදී පවත්වා තිබුණු යොවුන් ලෝක ශූරතා නෙට්බෝල් තරගාවලිය සඳහා සහභාගී වීමට ක්‍රීඩිකාවන් 12 දෙනෙකු හා නිලධාරීන් 02 තේරීපත්ව තිබූ නමුත් ඔවුන්ට මෙම තරගාවලිය සඳහා සහභාගී වීමට නොහැකි වී තිබුණි. උක්ත තරගාවලිය සඳහා සහභාගී වන ක්‍රීඩිකාවන් හා නිලධාරීන් සඳහා ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ අනුමැතිය නොමැතිව අයදුම්පත ඉදිරිපත් කර තිබුණි. සහභාගී වන ක්‍රීඩිකාවන් ඇතුළු නිලධාරී මණ්ඩලය වෙනුවෙන් ගුවන් ප්‍රවේශපත්‍ර ගාස්තු, වීසා ගාස්තු, ආහාර හා නේවාසික පහසුකම් වෙනුවෙන් 2025 මාර්තු 19 වන දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව රු.1,053,875 ක නිෂ්කාර්යය වියදමක් දරා තිබුණි.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා යොමු කරනු ලැබූ විගණන විමසුම් 12 කට මෙම වාර්තාවේ දිනය දක්වාම පිළිතුරු ලබා දී නොතිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) ගාල්ල දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලනය හා නඩත්තු කිරීම් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනය වෙත පවරා තිබූ කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු. 546,864 ක විදුලි හා ජල බිල්පත් ශ්‍රී ලංකා වොලිබෝල් සම්මේලනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ භාරයේ යටතේ පවතින ක්‍රීඩා සංගම් හා සම්මේලන 10 කට අදාළ 2024 හා 2025 වර්ෂයට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ලබා දීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) රිඩී ඇවනිව්හි පිහිටි ක්‍රීඩා නේවාසිකාගාරයෙහි ඉහල මහළ තුල ඉදිකර තිබූ වහලය ගලවා ඉවත් කර තිබුණු අතර එලෙස ගලවා ඉවත් කරන ලද වහලයේ සවිකර තිබූ යකඩ බට විශාල ප්‍රමාණයක් නේවාසිනාගාරයේ එක් කොටසක ගොඩගසා තිබුණු බැවින් නේවාසිකාගාරය භාවිතා කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් අපහසුතාවයට පත් වී තිබුණි. තවද මෙම වහලය නැවත ප්‍රතිසංස්කරණය කිරීමටද විගණිත දින වූ 2025 දෙසැම්බර් 30 වන දින දක්වා කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

5 තිරසාර සංවර්ධනය

5.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු දෙක ඉටුකර ගැනීම සඳහා යොදාගත් ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය සියයට 49 ක් හා සියයට 74 ක් විය.

(ආ) උක්ත තිරසාර සංවර්ධන අරමුණ ඉටු කර ගැනීම සඳහා දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව සියයට 20 කින් ඉහළ නැංවීමේ දී ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයන්ගේ සංඛ්‍යාව සියයට 0 ත් සියයට 49 ත් අතර ප්‍රගතියක් පෙන්නුවද, ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ක්‍රියාකාරීත්වය සහ ඔවුන්ගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සහ මානව සම්පත්වල පවතින ඌනතාවය හේතුවෙන් අදාළ අරමුණ ලඟා කර ගැනිමට නොහැකි වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 7 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 16 ක් ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 74 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 24 ක් ද, පැවතුණි.

(ආ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය **50%** ට වඩා අඩු මට්ටමක පැවතුණි.

ඊ.කේ.කේ.එස්. එදිරිසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
1. අදාල වර්ෂය තුළ නිමකල ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රමාණය	_	-	√
2. අන්තර්ජාතික පදක්කම් ප්‍රමාණය	_	-	√

05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50 % - 74%	75% - 100%
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගෙම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම.	ජාතික මට්ටමින් ක්‍රීඩා උළෙල පැවැත්වීම	ජාතික මහා ක්‍රීඩා උළෙල දී පිහිටු වන ලද ශ්‍රී ලංකා වාර්තා ගණන	√	_	_
	දැනට ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතා කරන සංඛ්‍යාව වාර්ෂිකව 20% කින් ඉහළ නැංවීම	ක්‍රීඩා යටිතල පහසුකම් භාවිතයට ගන්නා පුද්ගලයින් ප්‍රමාණය			
සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	2028 වන විට ප්‍රධාන ක්‍රීඩා 5කින් ඔලිම්පික් පාරිසාධන මට්ටම කරා ළඟාවීම හා ජයග්‍රහණයක් ලබා ගැනීම	හඳුනාගත් ක්‍රීඩා තරඟාවලින්හි දී සහ ශූරතාවලදී දිනාගත් ජාත්‍යන්තර පදක්කම් ගණන	_	√	_

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජයග්‍රහණ :

- ජපානයේ කෝබෙ 2024 පැරාලිම්පික් මලල ක්‍රීඩා ලෝක ශූරතා තරඟාවලියේ දී F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් ලෝක වාර්තාවක් සමඟින් සමිත දුලාන් විසින් රන් පදක්කම දිනා ගැනීම
- 2024 ප්‍රංශයේ පැරිස් හි පැවති පැරාලිම්පික් තරඟාවලියේ F 44 හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් සමිත දුලාන් විසින් රිදී පදක්කම දිනා ගැනීම
- මොරොක්කෝවේ පැවති 2024 ග්‍රෑන්ඩ් ෆික්ස් ලෝක පැරා මලල ක්‍රීඩා තරඟාවලියේ දී රන් පදක්කම් 02 ක් හා රිදී පදක්කම් 05 ක් දිනා ගැනීම
- 21 වන ආසියානු කණිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලියේ දී රිදී පදක්කම් 02 ක් හා ලෝකඩ පදක්කම් 02 ක් පදක්කමක් දිනා ගැනීම
- තායිවානයේ පැවති විවෘත මලල ක්‍රීඩා තරඟාවලියේ දී මීටර් 400 ඉසව්වෙන් එස්.අරුණ දර්ශන විසින් රන් පදක්කමක් හා තරුශි කරුණාරත්න විසින් මීටර් 400 හා මීටර් 800 ඉසව්වෙන් රන් පදක්කම් 2 ක් දිනා ගැනීම.

- ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම විසින් 2024 ආසියානු ශූරතාවය දිනා ගැනීම.
- IFBB ආසියානු කායවර්ධන ශූරතා තරඟාවලියේ දී රිදී පදක්කම් 03 ක් හා ලෝකඩ පදක්කමක් දිනා ගැනීම.
- ශ්‍රී ලංකා පිරිමි ක්‍රිකට් කණ්ඩායම විසින් නවසීලන්තය සමඟ පැවති ටෙස්ට් තරඟාවලියේ ශූරතාවය දිනා ගැනීම

අභියෝග :

1. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා විශ්ලේෂණය කිරීම සඳහා වන මධ්‍යස්ථානයක් නොතිබීම.
2. ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනයන්හි ක්‍රියාකාරීත්වය සහ ඔවුන්ගේ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් මානව සම්පත්වල පවතින ඌනතාවය.
3. ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ජාත්‍යන්තර තරග අවස්ථා ප්‍රමාණවත් පරිදි ලබාදීම හා ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබාදීමට වාර්ෂිකව මුදල් අමාත්‍යාංශය මගින් වෙන්වන ප්‍රතිපාදන කළමනාකරණය කරගනිමින් ක්‍රීඩාවේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට සිදුවීම.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	17	10	07	-
තෘතියික	23	07	16	-
ද්විතියික	254	180	74	-
ප්‍රාථමික	101	77	24	-
එකතුව	**395**	**274**	**121**	**-**

06.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේ දැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පුරප්පාඩුව පවතින තනතුරුවලට අදාල රාජකාරී සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව අතර බෙදාදීම මගින් හා නිළධාරීන් අතිකාල සේවයේ යොදා ගැනීම මඟින් අදාල රාජකාරී ආවරණය කර ගන්නා අතර, මෙම පුරප්පාඩුව පවතින තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා නියමිත බඳවා ගැනීම් ක්‍රම අනුගමනය කරනු ලැබේ. එසේම ආයතනයේ කාර්යසාධනය ඉහල නැංවීම සඳහා මෙම පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ පුහුණු පාඨමාලා-2025						
අනු අංක	**වැඩසටහනේ නම**	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාල සීමාව**	**දේශීය / විදේශීය**	**සමස්ත ආයෝජනය දේශීය (Rs. 000)**	**නිමවුම / ලබාගත් දැනුම**
1	Government Payroll System	4	දින 03	දේශීය	72,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
2	National Diploma in Procurement Administrative	2	අවුරුදු 01	දේශීය	150,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

3	Personal File Management	1	දින 03	දේශීය	18,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
4	අභ්‍යන්තර විගණන පරිචය	3	දින 01	දේශීය	42,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
5	විධිමත් ලිපිගොනුකරණය	1	දින 01	දේශීය	14,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
6	රියදුරන් සඳහා එක් දින වැඩමුළුව	1	දින 01	දේශීය	6,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
7	Government Payroll System	2	දින 03	දේශීය	36,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
8	New Procurement Guidelines 2024	8	දින 01	දේශීය	148,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
9	Frist Olympic Solidarity Sport Administrators Course (OSSAC) - 2025	6	දින 04	දේශීය	150,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
10	Frist Olympic Solidarity Sport Administrators Course (OSSAC) - 2025	2	දින 04	දේශීය	50,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
11	පැය 100 දෙමළ භාෂා පාඨමාලාව	56	2024.12.05 - සිට 2025.06.26	දේශීය	37,500.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
12	අභ්‍යන්තර විගණනය හා විමර්ශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	1	දින 10	දේශීය	45,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
13	Advanced MS Excel Skills	1	දින 02	දේශීය	13,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
14	තොරතුරු පද්ධති විගණනය	5	දින 01	දේශීය	62,500.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
15	Diploma in Professional English	4	අවුරුදු 01	දේශීය	368,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
16	අභ්‍යන්තර විගණනය හා විමර්ශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	1	දින 10	දේශීය	45,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
17	අභ්‍යන්තර කටයුතු ඒකකයේ කාර්යභාරය	140	දින 01	දේශීය	5,600.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ පුහුණු පාඨමාලා-2025						
අනු අංක	**වැඩසටහනේ නම**	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩසටහනේ කාල සීමාව**	**දේශීය / විදේශීය**	**සමස්ත ආයෝජනය දේශීය (Rs. 000)**	**නිමවුම / ලබාගත් දැනුම**
18	Data Analysis with SPSS for Beginners	2	දින 02	දේශීය	26,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
19	ගබඩා කළමනාකරණය, ඉන්වෙන්ට්‍රි පාලනය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, වත්කම් අපහරණය	5	දින 01	දේශීය	65,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

20	TOT- Fencing for Modern Pentathlon Training	1	දින 02	දේශීය	10,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
21	පුහුණුකරු උසස් පාඨමාලාව (පාපන්දු/වොලිබොල්) 2025-2026	2	2025.04.21 දින සිට 2026.04.20 දක්වා අවුරුදු 01	දේශීය	109,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
22	Advanced MS Excel Skills	1	දින 02	දේශීය	13,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
23	කාර්යාල ක්‍රම සහ මුදල් රෙගුලාසි	3	දින 02	දේශීය	39,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
24	ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම හා පවත්වා ගෙන යාම	3	දින 02	දේශීය	39,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
25	භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නව වෙනස්කම් පිළිබඳ වැඩමුළුව	6	දින 02	දේශීය	78,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
26	ක්‍රීඩා භූමි සහායක නිලධාරීන් 25 දෙනෙකු සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම	25	දින 03	දේශීය	230,800.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
27	Physical Literacy Foundation Sports Field in Sri Lanka - ක්‍රීඩා පුහුණුකරුවන් හා නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන	100	දින 04	දේශීය	126,116.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.
28	Certificate Course in Sports Injury Management - 2025	1	2025.09.18 - 2025.11.28	දේශීය	20,000.00	අදාල විෂය සම්බන්ධ දැනුම ලබා ඇත.

❖ **ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

මෙහිදී නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වීමෙන් සේවක හැකියාවන් සෘජුවම වැඩි දියුණු වේ. හැකියාව වැඩිවන විට සේවකයාගේ ආත්මාභිමානය, ආත්ම විශ්වාසය හා සේවක තෘප්තිය වැඩි වන අතර, එමඟින් සේවක අභිප්‍රේරණය වැඩි වේ. එමෙන්ම මෙම සෑම ගුණාංගයන්ම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යඵලය ඉහළ යනු ඇත. මේ අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් ලබා දීම තුළින් ආයතනයේ කාර්යසාධනය ඉහළ ගොස් ඇත.

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත්කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම (වාහන පිළිබඳ)	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		

4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	අංශවල පවතින සේවක පුරප්පාඩු හේතුවෙන්	සෑම අංශයක්ම මේ සඳහා ප්‍රමුඛතාවයකින් කටයුතු කරන ලෙසට දැනුවත් කිරීම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ (40)4 උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		
8	**වත්කම් කලමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	දැනට ඇති එක් වාහනයක් අපහරණය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනයෙන් කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			

15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරීයෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල නොවේ	තාක්ෂණික ගැටළුවක් පවතී	දැනට ඇති නිල වෙබ් අඩවියේ පවතින තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් නව නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී.
අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)**	**අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.**	**අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		